

**<u>අපි දැන් බලමු Microsoft Teams App එක තමන්ගේ Mobile Phone එකට කොහොමද Install කර ගෙන Configure කර ගන්නේ කියලා.</u>**

Microsoft Teams App එක ඔබගේ ජංගම දුරකථනයට Download කිරීමේදී Android Phone වල නම් Play Store හරහාද Apple Phone වල App Store හරහාද Download කර ගැනීමට හැකියාව ඇත.


Android Phone එකක් සඳහා Microsoft Teams App එක Download කර Configure කර ගන්නේ කෙසේදැයි අපි පියවරෙන් පියවර ඉගෙන ගමු.

<table>
<tr>
<td>


</td>
<td>1. පළමුවෙන්ම ඔබගේ Mobile Phone එකේ ඇති Play Store වෙත ගොස් එහි Search for Apps & games යන ස්ථානයේ Microsoft Teams ලෙස Type කර Search කළ යුතුය.</td>
</tr>
</table>






2. අනතුරුව ඔබට Microsoft Teams App එක පිළිබඳ විස්තර ඇතුලත් screen එකක් දැකිය හැකි වන අතර එහි ඇති Install button එක මත press කරන්න.





3. Installation එක අවසන් වූ පසු Uninstall සහ Open වශයෙන් buttons 2ක් ඔබට දැකිය හැකි අතර එයින් Open යන button එක මත press කරන්න.

යම් හේතුවක් මත මෙම screen එක close වී ඇත්නම් ඔබගේ Home Screen එකේ Apps අතර ඇති Teams icon එක මත press කිරීමෙන් App එක Open කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

<table>
<tr>
<td>



</td>
<td>
4. Microsoft Teams screen එකේ Sign in සහ Sign up for Free වශයෙන් option 2ක් ඔබට දැක ගැනීමට හැකි වනු ඇත.<br><br>ඔබ මෙම අවස්ථාවේදී Microsoft Teams App එකට ප්‍රථමවරට Login වන බැවින් Sign in යන option එක තෝරාගන්න.
</td>
</tr>
<tr>
<td>


</td>
<td>
5. Microsoft Team Account එකකට Sign in වීමට Teams App එක වෙනුවෙන් නිර්මාණය කළ Email Address එකක් වුවමනා වේ. ඔබ වෙනුනේ JMC ආයතනය එය නිර්මාණය කර ඇති අතර ශාඛාවට පැමින එය ලබාගත හැක.<br><br>ඔබට ලැබුනු Email Address එක Email Address යන ස්ථානයේ type කර Sign in මත press කළ යුතුය.
</td>
</tr>
</table>




1. ඉන් අනතුරුව ඔබගේ Teams Email ID එකට අදාල Password එක type කිරීමට සිදුවේ.

   මේ සඳහා අවශ්‍ය Password එකද Email Address එක සමග JMC ශාඛාවෙන් ලබා ගැනීමට ඔබට හැකියාව ඇත.








2. ඉන් අනතුරුව ලැබෙන Screen එකේදී ඔබට JMC ආයතනයෙන් ලැබුන Default Password එක වෙනස් කිරීමට අවස්ථාවක් ලැබේ. එහිදී ඔබට Current Password, New Password සහ Confirm Password යන ස්ථාන සඳහා තොරතුරු ලබා දීමට සිදුවන අතර එම ස්ථානයන් වල ලබා දෙන Password තොරතුරු හොඳින් මතක තබා ගැනීමට සිදු වනු ඇත.



   Current Password යන ස්ථානයට ඔබට ලැබුන Default Password එකද, New Password සහ Confirm Password යන ස්ථාන සඳහා ඔබ කැමති නව Password එකක්ද ලබා දිය හැකිය.



   යම් හෙයකින් ඔබගේ New Password තොරතුරු අමතක වුවහොත් ඔබගේ Teams Account එකේ Password Reset කිරීමට සිදුවනු ඇත. එසේත් නොමැති නම් ඔබගේ Teams Account එකට Login වීමට නොහැකි වනු ඇත. එම නිසා මෙම Password තොරතුරු හොඳින් මතක තබා ගැනීම වැදගත් වනු ඇත.


   ඉන්අනතුරුව Sign in මත press කරන්න.

| | |
|---|---|
|  | 3. ඉන් අනතුරුව ඔබගේ Teams Account එකේ ආරක්ෂාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය තවත් Security Information ලබා දීමට සිදුවනු බව දන්වමින් තොරතුරු ඇතුලත් පණිවිඩයක් දැකිය හැකිය.<br><br>එය කියවා අනතුරුව Next මත press කරන්න. |
|  | 4. අනතුරුව ඔබට don't lose access to your account යන screen එක දැකිය හැකි අතර එහිදී ඔබගේ Account එකේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ආකාර 2කින් තොරතුරු විමසනු ඇත.<br><br>එනම් "Authentication Phone is not configured" සහ "Authentication Email Address is not configured" වශයෙනි.<br><br>අවම වශයෙන් මෙම Option 2කින් එකක්වත් ඔබ සම්පූර්ණ කිරීම කළ යුතුය. මෙම security option දෙකෙන් එකක් හෝ Setup නොකර Teams Account එකට Login වීමට ඔබට හැකියාවක් නොලැබෙනු නැත. මෙය අනිවාර්ය අංගයකි.<br><br>මෙම අදියරේදී ක්ෂණිකව පරීක්ෂා කල හැකි පෞද්ගලික Email Address එකක් හෝ ජංගම දුරකතන අංකයක් ඔබට තිබිය යුතුය.<br><br>එසේම මෙම ක්‍රියාවලිය සඳහා ඔබට ලැබෙනුයේ විනාඩි 15ක් වැනි කෙටි කාලයකි. මෙම කාලය තුල Authentication කටයුතු අවසන් කල යුතුය.<br><br>එම නිසා දැන් Authentication Email Address is not configured ඉදිරියෙන් ඇති Set it up Now යන link එක මත press කර Email Authentication Option එක තෝරා ගෙන ඉදිරියට යා හැකිය. |

<table>
<tr>
<td>
</td>
<td>5. එවිට ඔබගෙන් Authentication Email address එකක් විමසනු ඇත. එම ස්ථානයේ තමන්ගේ පෞද්ගලික Email address එකක් type කිරීමට හැකියාව ලැබෙනු ඇත. අනතුරුව email me යන button එක මත press කල යුතුය.<br><br>Authentication ක්‍රියාවලිය සඳහා විනාඩි 15ක කාලයක් ලැබෙන අතර එම කාලය ඉක්මවා ගියහොත් ඔබගේ Validation code verify කිරීමේ ක්‍රියාවලිය expire වනු ඇත. එවිට ඔබට නැවත Validation Code එකක් request කිරීමට සිදුවනු ඇත. එම නිසා ඔබ මෙම ක්‍රියාවලිය විනාඩි 15ක් ඇතුලත අවසන් කිරීමට සැළසුම් කර ගත යුතුය.</td>
</tr>
<tr>
<td>
</td>
<td>6. email me මත press කිරීමෙන් අනතුරුව ඔබ ලබාදුන් Email Address එකට validation code එක අඩංගු Email message එකක් ලැබෙනු ඇත.<br><br>එම email එක පරීක්ෂා කිරීමේදී Your code is ලෙස සඳහන්ව අංක 6 ක code එකක් ඔබට දැකිය හැකිය.<br><br>එම code එක Microsoft Teams configuration screen එකේ verification code යන ස්ථානයේ type කර verify යන button එක මත press කළ යුතුය.</td>
</tr>
</table>

<table>
<tr>
<td>
</td>
<td>7. අනතුරුව Don’t lose access to your account යන screen එකට නැවත පැමිණෙන අතර එහිදී Authentication Email Address is set to (පෞද්ගලික Email address එක) ලෙස වෙනස් වී ඇති ආකාරය ඔබට දැකිය හැකිය.<br><br>අනතුරුව Finish මත press කල යුතුය. එවිට මෙම Account setup කිරීමේ ක්‍රියාවලිය අවසන් වේ.</td>
</tr>
<tr>
<td>
</td>
<td>8. අවසාන වශයෙන් හැඳින්වීමේ තොරතුරු ඇතුලත් Messages කිහිපයක් දැකිය හැකි අතර එවා කියවා Next මත press කල යුතුය.</td>
</tr>
</table>

| | |
|---|---|
|  | 9. අවසාන වශයෙන් හැදින්වීමේ තොරතුරු ඇතුලත් Messages කිහිපයක් දැකිය හැකි අතර එවා කියවා Next මත press කල යුතුය. |
|  | 10. අවසාන වශයෙන් හැදින්වීමේ තොරතුරු ඇතුලත් Messages කිහිපයක් දැකිය හැකි අතර එවා කියවා Next මත press කල යුතුය. |




11. ඔබගේ Microsoft Teams Account එකට setup කර අවසන් වූ පසු එම Account එකට Automatically Login වනු ඇත. නිසි ආකාරයෙන් ඔබ Microsoft Teams Account එක setup කර ඇත්නම් මෙවැනි Interface එකක් ඔබට දැක ගැනීමට හැකි වනු ඇත.

    අනතුරුව මෙම Interface එක භාවිතයෙන් ඔබටගේ Teams class එකට අදාල සියළු කටයුතු කළමණාකරණය කල හැකි අතර ඔබගේ Online දේශන සඳහාද සහභාගී වීමට හැකියාව ලැබෙනු ඇත.